tamilguru.lk

**අභ්‍යන්තර බඳවා ගැනීමේ නිවේදනයයි!**

PPSC/EX/3/2/1/2022
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2022.04.08

**<u>උපාධිධාරී අභ්‍යාසලාභීන් හා සංවර්ධන නිලධාරීන් වයඹ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I(අ) ශ්‍රේණියේ ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2022</u>**

අංක අමප : 21/0658/340/013 හා 2021.04.19 දිනැති හා අංක අමප: 21/2076/315/033-1 හා 2021.12.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ හා වයඹ පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව, වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම මත බඳවා ගැනීමට, පහත සඳහන් නිලධාරී කාණ්ඩයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020 යටතේ බඳවාගනු ලැබූ සියලුම උපාධිධාරී අභ්‍යාසලාභීන් හා එම වැඩසටහන යටතේ බඳවාගනු ලැබ සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලැබූ කණ්ඩායම.

- 2018 සහ 2019 වසරවලදී ක්‍රියාත්මක කළ "අභ්‍යාසලාභී උපාධිධාරීන්හට රජයේ ආයතනවල පුහුණුවක් ලබා දීම" වැඩසටහන යටතේ උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවාගනු ලැබ සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලැබූ කණ්ඩායම.

- ඩිප්ලෝමාධාරීන් බඳවා ගනු ලබන විෂයයන් සඳහා උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන් යටතේ 2018, 2019 හා 2020 වර්ෂවල බඳවාගනු ලැබූ ඩිප්ලෝමාධාරීන්.

**01. 1.1** අධ්‍යාපන සුදුසුකම් **:-**

I. ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපාධියක්/ ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය.

සහ

II. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් සහිතව එම විභාගය සමත්ව තිබිය යුතුය.

**1.2 කායික සහ මානසික යෝග්‍යතාවය:-**

සෑම අපේක්ෂකයෙකුම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටුකිරීමට සරිලන මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**1.3 වයස:-**

2019.12.31 දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**02. වෙනත් සුදුසුකම්:-**

I. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.



tamilguru.lk

II. අයදුම්කරුවන්හට ගුරු පත්වීමක් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා වයඹ පළාත තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතුය. අදාළ විෂයය පුරප්පාඩුවට බඳවා ගැනීමේදී වයඹ පළාත තුළ ස්ථිර පදිංචි සුදුසුකම්ලාභීන් නොමැති අවස්ථාවකදී පමණක් වෙනත් පළාත්වල ස්ථිර පදිංචි අයදුම්කරුවන් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

III. අයදුම්කරු/අයදුම්කාරිය විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

IV. වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

**03. වැටුප් ක්‍රමය:-**

තාවකාලික ගුරු පත්වීම් කාලසීමාව තුළ, සංවර්ධන නිලධාරි තනතුරට හිමි වැටුප් පරිමාණයට අදාළව වැටුප් ගෙවනු ලබන අතර, ගුරු සේවයේ නිත්‍ය පත්වීම් ලද පසු ඊට අදාළ වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ.

**04. සේවා කොන්දේසි :-**

I. රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනයන්ට ද යටත්ව තෝරාගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පත්කරනු ලැබේ.

II. මෙසේ ලබා දෙනු ලබන ගුරු පත්වීම තාවකාලික ගුරුපත්වීමක් වන අතර, පත්වීම්ලාභියා පත්වී ලබන පාසලේ වසර 10 ක කාලයක් අනිවාර්ය සේවා කාලයකට යටත් විය යුතුය.

III. තාවකාලික පත්වීම ලබා දී වසර 3ක් ඇතුළත වයඹ පළත් සභා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ලිඛිත විභාගයක් පවත්වා, ඉන් සමත් වන නිලධාරින් සඳහා පමණක් නිත්‍ය පත්වීම් ලබා දෙනු ලැබේ.

IV. ම විභාගය අසමත් වන අයදුම්කරුවන් සඳහා වසරක් තුළ නැවත විභාගයක් පැවැත්වීම හෝ ඔවුන් පෙරළා සිටි තනතුරට පත් කිරීම හෝ උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන නිලධාරීන් ලෙස අනුයුක්ත කිරීම හෝ සිදු කරනු ලැබේ.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :-**

5.1. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය විෂයයන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනමින් බඳවා ගනු ලැබේ.

5.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පාදකව පවතින ගුරු පුරප්පාඩු සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමේදී එක් එක් අයදුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් සළකා විෂයානුබද්ධව පවතින පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

5.3 තෝරාගැනීම් සඳහා, සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇත්ද යන්න පරීක්ෂා කර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ලැබේ.

5.4 එක් එක් භාෂා මාධ්‍යයෙන් පවතින විෂයය පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීමේදී සම්මුඛ පරීක්ෂණයේ ලකුණු හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු යන දෙකෙහිම එකතුවේ ප්‍රමුඛතාව අනුව පත්වීම් ලබාදෙනු ලැබේ.

**06. 6.1 සම්මුඛ පරීක්ෂණය:-**

අයදුම්පත්‍ර ඉදිරිපත් කරන අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා, බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර තිබේද යන්න පරීක්ෂා කර, පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

**(අ) උපාධිය හා පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබා දීම (ලකුණු 10 )**

| අනු අංකය | උපාධිය සඳහා ලකුණු ලබා දීම | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | විශේෂවේදී උපාධිය | | 10 |
| 02 | සාමාන්‍ය උපාධිය | පළමු පෙළ ඉහළ පන්ති සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධිය | 10 |
| | | දෙවන පෙළ ඉහළ පන්ති සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධිය | 8 |
| | | දෙවන පෙළ පහළ පන්ති සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධිය | 6 |

**(ආ) අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම. (ලකුණු 15)**

| අනු අංකය | නිර්ණායකය | උපරිම ලකුණු |
|---|---|---|
| 01 | දහම් පාසල් අවසාන විභාගය හෝ ධර්මාචාර්ය විභාගය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත්වී ඇති බවට පිළිගත් සහතිකයක් ලබා තිබීම. | 05 |
| 02 | ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ සඳහා සහතික එකක් හෝ කිහිපයක් ලබා තිබීම. | 05 |
| 03 | දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක* අවම වශයෙන් වසර 03ක කාල සීමාවක් පදිංචිව සිටීම. | 05 |
| | මුළු ලකුණු | 15 |

* වයඹ පළාත තුළ දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ලෙස හඳුනාගෙන ඇති පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පාසලක පවතින පුරප්පාඩු විෂයයන් සඳහා මනාපය පළ කරන අවස්ථාවකදී එම අයදුම්කරු එම දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවම වශයෙන් වසර 03ක කාලයක් ස්ථිරව පදිංචිව සිටින බවට ග්‍රාම නිලධාරි සහතිකයක් මඟින් සනාථ කරන්නේ නම්, ඒ සඳහා ලකුණු 05 ක් ලබා දෙනු ලැබේ.

| කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
|---|---|
| නිකවැරටිය | පුත්තලම |
| රස්නායකපුර | කල්පිටිය |
| කොටවෙහෙර | ආණමඩුව |
| පොල්පිතිගම | කරුවලගස්වැව |
| ඇහැටුවැව | මහකුඹුක්කඩවල |

| | |
|---|---|
| ගල්ගමුව | මුන්දලම |
| අඹන්පොල | නවගත්තේගම |
| ගිරිබාව | පල්ලම |
| මහව | වනාතවිල්ලුව |
| | ආරච්චිකට්ටුව |

### 6.2 ප්‍රායෝගික පරීක්ෂණය (උපරිම ලකුණු 25)

ඉහත 6.1 හි සඳහන් පරිදි පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේදී අයදුම්කරු විසින් විනාඩි 10කට නොඅඩු, තම විෂයයට අදාලව හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ, පාඩමක් ඉදිරිපත් කළ යුතුය. එම ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත පරිදි උපරිම ලකුණු 25ක් ලබා දෙනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 5 | 2 |
| 2 | පෞරුෂය හා හඬ පාලනය | 5 | 2 |
| 3 | සන්නිවේදනයේ පැහැදිලි බව | 5 | 2 |
| 4 | කාල කළමනාකරණය | 5 | 2 |
| 5 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 5 | 2 |
| | මුළු ලකුණු ගණන | 25 | 10 |

- ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 10 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
- ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායකයට අවම වශයෙන්ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

### 07. තෝරා ගැනීමේ ක්‍රමය:-

- ක් එක් භාෂා මාධ්‍යයෙන් පවතින විෂයය පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීම දී, සම්මුඛ පරීක්ෂණයේ ලකුණු හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු යන දෙකෙහිම එකතුවේ ප්‍රමුඛතාව අනුව පත්වීම් ලබා දෙනු ලැබේ. පත්වීමක් සඳහා සුදුසුකම් ලැබීමට ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම අනිවාර්ය වේ.

- ඩිප්ලෝමාධාරීන් බඳවා ගතහැකි යම් විෂයක් සඳහා සුදුසුකම් ලැබූ උපාධිධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැතිනම් පමණක්, සුදුසුකම් සහිත ඩිප්ලෝමාධාරීන්ගෙන් අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සළකා බලනු ලැබේ.

### 08. විෂයයන් තෝරාගැනීම සඳහා උපදෙස් :-

8.1 අයදුම්කරුගේ උපාධියේ ප්‍රධාන විෂයයන්ට අදාළව තම මනාපය පරිදි විෂයයන් 01ක් සඳහා ඉල්ලුම් කළ හැකිය.
එක් එක් විෂයයට සහ භාෂා මාධ්‍යයට අදාළව පද්ධතියේ පවතින ගුරු පුරප්පාඩු හා විෂයය සුදුසුකම් ලේඛනය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පාදකව www.psc.nw.gov.lk වෙබ් අඩවියේ සඳහන් කර ඇත.

වැදගත් :- **එක් එක් විෂයය සඳහා අයදුම් කිරීමේදී එම විෂයය තම උපාධියෙහි ප්‍රධාන විෂයයක් වශයෙන් හදාරා තිබීම අනිවාර්යය වේ.**

8.2 එක් පුරප්පාඩු විෂයයක් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03ක් සඳහා මනාපය පළකල හැක.

8.3 ගුරු පත්වීම් සඳහා තෝරා ගැනීම හා පත්වීම් ලබාදීම සිදුකරනු ලබන්නේ, පුරප්පාඩු සංඛ්‍යාවට අදාළව සම්මුඛ පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල එකතුවෙහි අනුපිළිවෙල අනුව පමණක් වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා මනාප ලකුණු කිරීම, ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

8.4 සම්මුඛ පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු එකතුවෙහි අනුපිළිවෙල අනුව තෝරාගැනීමේදී අයදුම්කරුවකු විසින් ඉල්ලුම් කරනු ලබන විෂයයන්ට අදාළව ගුරු පුරප්පාඩු සම්පූර්ණ වී ඇත්නම් වෙනත් විෂයයක් සඳහා ගුරු පත්වීමක් ලබා දීම හෝ මනාප ලකුණු කරනු ලබන ඕනෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා ගුරු පත්වීමක් ලබා දීම හෝ මනාපය පළකරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි අදාළ විෂය පුරප්පාඩු නොමැති වේ නම්, වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක විෂයය පුරප්පාඩුවක් සඳහා පත්වීම් ලබා දීම හෝ මේ සම්බන්ධයෙන් පැනනගිනු ලබන ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් අවසන් තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

## 09. අයදුම් කළ යුතු පිළිවෙල :-

- වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වන www.psc.nw.gov.lkවෙබ් අඩවියට පිවිස මාර්ගගත ක්‍රමය (Online) මඟින් තම අයදුම්පත්‍රය යොමු කළ යුතුය.

- අයදුම්පත්‍රයෙහි සඳහන් කරුණුවලට අමතරව සඳහන් කළ යුතු කරුණු වේ න  ඒ බව දත්ත පද්ධතියේ Requests/Comments තීරුවේ සඳහන් කළ යුතුය.

- අයදුම්පත්‍ර කැඳවීමේ අවසන් දිනය 2022.05.10 වේ.

## 10. වෙබ් අඩවිය පරිශීලනය කිරීමේ පොදු උපදෙස් :-

- අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය (N.I.C. Number) තම user name එක ලෙස භාවිතා කළ යුතු අතර ලියාපදිංචිය සම්පූර්ණ වීම සඳහා ඔහු/ඇය විසින් මුරපදයක් (password) ලබා දෙමින් නැවත login විය යුතුය. Login වූ පසුව මුර පදය (password) වෙනස් කිරීමට ඉඩ ලබාදෙනු නොලැබේ.

- අයදුම්කරුගේ මුරපදය (password) සිහිතබා ගැනීම මඟින්, ඇතුළත් කරන ලද තොරතුරු සංශෝධනය කිරීමට හැකියාවක් ඇත.

- අයදුම්පත්‍ර කැඳවීමේ අවසන් දිනය දක්වා අයදුම්කරුවන්ට තම තොරතුරු සංශෝධනය කිරීමට හැකියාව පවතී.

- අයදුම්පත්‍ර කැඳවීමේ අවසන් දිනට පසුව කරනු ලබන ඉල්ලීම් භාරගනු නොලැබේ.

- මාර්ගගත අයදුම්පතේ පුද්ගලික තොරතුරු, අධ්‍යාපනික සුදුසුකම් හා අභිමත ප්‍රාදේශීය ලේක කොට්ඨාස තේරීම යන කොටස් අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය.

- ක් අයදුම්කරුවෙකුට එක් වරක් පමණක් ලියාපදිංචි වීම සඳහා අවස්ථාව හිමිවේ.

**11. වෙබ් අඩවිය පරිශීලනය කිරීමේ තාක්ෂණික උපදෙස් :-**

- Login වූ පසු අයදුම්කරු විසින් මුර පදයක් (password) ලබා දිය යුතුය. එසේ ලබා දෙනු ලබන මුර පදය (password) ඔස්සේ තමන්ගේ පෙර තේරීම සංශෝධනය කළ හැකිය.

- මුරපදය ලබා දීමට පෙර තොරතුරු කියවා අවබෝධ කර ගැනීමෙන් පසු පමණක් අදාළ ස්ථානයෙ (✓) සලකුණ යෙදිය යුතුය.

- තිරයේ 'මුරපදය ලබා දීම සාර්ථකයි' යනුවෙන් දිස්වනු ඇත. 'ඉදිරියට යන්න' බොත්තම click කිරීමෙන් පසුව නැවතත් මුල් පිටුව වෙත යොමු වනු ඇත. පෙර පරිදිම තමන්ගේ ලියාපදිංචි වූ ජාතික හැඳුනුම්පත් අංකය (N.I.C. Number) හා භාෂා මාධ්‍යය ලබාදීමෙන් පසු, පෙර ලියාපදිංචි වූ මුර පදය (password) යොදා නැවත වාරයක් ප්‍රවේශ (login) විය යුතුය.

- පසුව අයදුම්කරුගේ පුද්ගලික තොරතුරු, අධ්‍යාපනික තොරතුරු හා අභිමත ප්‍රාදේශීය ලේක කොට්ඨාස තේරීමේ තොරතුරු ඇතුළත් කළ යුතුය.

- අයදුම්කරුගේ මනාපය මත පුරප්පාඩු ප්‍රාදේශීය ලේකම් කොට්ටාස නම් කිරීමට අවස්ථාව හිමිවේ. ඒ සඳහා **විෂයයන් තෝරාගැනීම සඳහා වන** උපදෙස් බලන්න. ඉන්පසු තොරතුරු ඇතුළත් කරන්න.

- අයදුම්කරුට තවදුරටත් මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් ඇත්නම්, මෙනුවෙහි requests/comments තීරුවේ සඳහන් කරන්න.

- අයදුම්කරු ඇතුළත් කළ තොරතුරුවල සාරාංශය පරීක්ෂා කර, ගැටලුවක් පවතී න 071 8695882 යන දුරකථන අංකය අමතා අවශ්‍ය උපදෙස් ලබාගන්න.

- අනතුරුව Download Iconය Click කර PDF ගොනුවක් ලෙස භාගත කර ගන්න. එලෙස භාගත කරගත් PDF ගොනුව මුද්‍රණය කර, නිසිලෙස දත්ත සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය තම ආයතන ප්‍රධානියා මඟින් සහතික කර අයදුම්පත බහාලන ලිපි කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"උපාධිධාරී අභ්‍යාසලාභීන් හා සංවර්ධන නිලධාරින් වයඹ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියේ ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2022"** සහ පදිංචි **පළාත** සඳහන් කර 2022.05.12 දිනට පෙර **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- යම් හෙයකින් අයදුම්කරුවකු විසින් අයදුම්පත්‍ර කැඳවීමේ අවසන් දිනයට පෙර තම අයදුම්පත සංශෝධනය කළහොත්, අවසන් වරට සංශෝධිත අයදුම්පතෙහි මුල් පිටපත පමණක් ඉහත තැපැල් ලිපිනයට එවිය යුතුය.

- ම අයදුම්පතෙහි ඡායා පිටපතක් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන අවස්ථාවේදී අනිවාර්යයෙන් රැගෙන පැමිණිය යුතුය.

- මාර්ගගත (Online) අයදුම්පත්‍ර කැඳවීමෙ අවසන් දිනට පසුව කරන අයදුම්පත්‍රයේ අඩංගු තොරතුරු සංශෝධනය කිරීම සඳහා වන ඉල්ලීම් භාරගනු නොලැබේ.

12. ඉහත තනතුරට අයදුම්පත්‍ර කැඳවීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරා ගැනීම/ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

13. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන හෝ ම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.බී. වික්‍රමසිංහ,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල
2022.04 .08

tamilguru.lk